# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය පනත

---

[සහතිකය සටහන් කළේ 2007 ජූලි මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2007 ජූලි මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා ජනරජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

මිල : රු. 12.00 යි. තැපැල් ගාස්තුව : රු.7.50 යි

# 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 2007 ජූලි මස 13 වන දින]

එල්.ඩී.—ඕ. 20/2006.

## ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයක් පිහිටුවීම සහ ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2007 අංක 26 දරන ජාතික භාෂා, අධ්‍යාපන සහ පුහුණු ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. (ලුහුඬු නාමය.)

I වන කොටස

## ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය පිහිටුවීම

**2**. (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය. ආයතනය මේ වගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ආයතනය විසින් නඩු පැවරීම ද ආයතනයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය. (ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය පිහිටුවීම.)

**3**. (1) ආයතනයේ පරිපාලන සහ කළමනාකරණ කටයුතු (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන ) මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි වූ සාමාජිකයන්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය. (කළමනාකරණ මණ්ඩලය.)

(2) (අ) මණ්ඩලය අමාත්‍යවරයා විසින් පත් කරන ලද පහත දැක්වෙන නිලබලයෙන් යුත් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(i) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ තත්කාලයේ ලේකම්ධුරය දරන තැනැත්තකු ;

(ii) රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ තත්කාලයේ ලේකම්ධුරය දරන තැනැත්තකු ;

(iii) තත්කාලයෙහි මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්ධුරය දරන තැනැත්තකු ;

(iv) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු සහ ජාතික ඒකාබද්ධතා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ තත්කාලයේ ලේකම්ධුරය දරන තැනැත්තකු ;

(ආ) භාෂා, සාහිත්‍යය සහ අධ්‍යාපන සහ කළමනාකරණ ක්ෂේත්‍රවල පළපුරුද්දක් පෙන්වා ඇති සහ කුසලතාවක් දක්වා ඇති තැනැත්තන් අතරින් අමාත්‍යවරයා විසින් පත් කරන ලද වෙනත් සාමාජිකයන් පස්දෙනකු.

(3) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සාමාජිකයන් අතරින් මණ්ඩලයේ සභාපතිවරයා තෝරා පත්කළ යුතු ය.

(4) මේ පනතේ උපලේඛනයේ විධිවිධාන මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීමට සහ ඔවුන්ගේ ධුරකාලයට, ඒ සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික, මණ්ඩලයේ රැස්වීම් සහ ආයතනයේ මුද්‍රාව සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

ආයතනයේ පරමාර්ථ.

4. ආයතනය පිහිටුවීමේ පරමාර්ථ සහ ආයතනය විසින් ඒවා සාක්ෂාත් කරගත යුතු අයුරු පහත දැක්වේ :—

(අ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පිළිබඳ දැනුම ලබා ගැනීමට කැමැත්තෙන් සිටින්නේ යම් තැනැත්තෙක් ද එවැනි තැනැත්තන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමට දක්ෂ ගුරුවරුන් බිහිකිරීම ;

(ආ) ලිඛිත නීතියකින් පිහිටුවන ලද ජාතික භාෂා පරිවර්තක සේවයෙන් සහ ජාතික භාෂණ පරිවර්තක සේවයෙන් පත්කළ යුතු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවල නිපුනතාවයන් ඇති පරිවර්තකයන් සහ භාෂණ පරිවර්තකයන් බිහිකිරීම ;

(ඇ) සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවලින් භාෂා ගුරුවරුන්, භාෂා පරිවර්තකයන් සහ භාෂණ පරිවර්තකයන් පුහුණු කිරීමට සුදුසුකම්ලත් ගුරුවරුන් බිහිකිරීම ;

(ඈ) මහජනයාට කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ත්‍රෛභාෂා හැකියාවැති තැනැත්තන් පුහුණු කිරීම.

5. ආයතනයේ කර්තව්‍යයන් විය යුත්තේ — ආයතනයේ කර්තව්‍යයන්.

(අ) සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා දැනුම ලබාගැනීමට අපේක්ෂා කරන තැනැත්තන්ට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමට දක්ෂ තැනැත්තන් බිහිකිරීම සඳහා සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පිළිබඳ දීර්ඝ පුහුණුවක් ලබාදීම ;

(ආ) ආයතනයේ ක්‍රියාකාරීත්වය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා ඒ පර්යේෂණ සහ අධ්‍යයනවල ප්‍රතිඵල භාවිත කිරීමේ අරමුණ ඇතිව භාෂා පුහුණු කිරීමට අදාළව පවතින ගැටළු පිළිබඳව පර්යේෂණ සහ අධ්‍යයන පැවැත්වීම ;

(ඇ) සුදුසු තැනැත්තන්ට භාෂා පුහුණුව සහ අධ්‍යාපනය ලබාදීම සහ ඒ පුහුණුවීම් සහ අධ්‍යාපනය සම්පූර්ණ කරන සාර්ථක අපේක්ෂකයන්ට සහතිකපත් සහ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම ;

(ඈ) භාෂා ඉගැන්වීම කරගෙන යාමට පුහුණු පුද්ගලයන්ගෙන් සමන්විත මණ්ඩලයක් පිහිටුවීම ;

(ඉ) භාෂාවන්ට අදාළ කාරණා පිළිබඳ වූ තොරතුරු තැන්පත් කර තබන ස්ථානයක් පිහිටුවීම ;

(ඊ) භාෂා පරිවර්තකයන්, භාෂණ පරිවර්තකයන් සහ ලඝු ලේඛකයන් යනාදී වශයෙන් විශේෂ කාණ්ඩවලට අයත් තැනැත්තන් සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් විශේෂිත භාෂා පුහුණු පාඨමාලා පැවැත්වීම ; සහ

(උ) අවශ්‍යයයි පෙනීයන අවස්ථාවක දී සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවල වැඩි දියුණු කිරීම් සහ ඒවාට කළ යුතු වෙනස්කම් පිළිබඳ අදාළ අධිකාරියට නිර්දේශ ඉදිරිපත් කිරීම, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා සහ විදේශීය භාෂා පිළිබඳ භාෂාමය පර්යේෂණ කටයුතු කරගෙන යාම, ඒවාට සහාය දැක්වීම සහ ප්‍රවර්ධනය කිරීම.

6. ආයතනයේ කර්තව්‍යයන් කාර්යක්ෂමව ඉටුකිරීමේ කාර්යය සඳහා ආයතනයට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය :— ආයතනයේ බලතල.

(අ) දේශීය සහ විදේශීය මූලාශ්‍රයන්ගෙන් චංචල සහ නිශ්චල වශයෙන් ලැබෙන ප්‍රදාන, පරිත්‍යාග, ත්‍යාග, රික්තවරණ පිළිගැනීම සහ භාරගැනීම සහ ආයතනයේ අරමුණු සහ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම පිණිස ඒවා අදාළ කරගැනීම ;

(ආ) යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෙස්තමේන්තු නීයාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් ආයතනය වෙත සතුවන චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම හා දැරීම සහ ආයතනයේ රීතිවලට යටත්ව ඒවා විකිණීම, පැවරීම, හුවමාරු කිරීම හෝ අන්‍යකාරයකින් බැහැර කිරීම ;

(ඇ) ආයතනයේ පරමාර්ථවලට දායක විය හැකි යම් කාර්යයන්වල දී එනම් සේවකයන් හුවමාරු කරගැනීම, උපදේශන සේවා ලබාගැනීම, පර්යේෂණ, සේවක පුහුණුකිරීම් හෝ සාමාන්‍ය පුහුණුකිරීම් සඳහා පූර්ණ වශයෙන් හෝ අර්ධවශයෙන් තම ආයතනයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ දරන ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටක ඇති අධ්‍යාපනික හෝ වෙනත් ආයතන සමග සහයෝගිතා ගිවිසුම්වලට ඇතුළත්වීම ;

(ඈ) කිසියම් බැංකුවක හෝ බැංකුවල ජංගම ගිණුම්, ඉතිරිකිරීමේ ගිණුම් හෝ තැන්පතු ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම ;

(ඉ) ආයතනයේ කර්තව්‍යයන් ඉටුකර ගැනීම පිණිස අවශ්‍යවිය හැකි සියලු ගිවිසුම්වලට ඇතුළත්වීම ;

(ඊ) මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය හැකි යම් සුරැකුම්පත්වල ආයතනයේ අරමුදල් ආයෝජනය කිරීම ;

(උ) ආයතනයේ අභිප්‍රායයන් යටතට ගැනෙන විෂයයන් පිළිබඳ වාර්තා, සඟරා සහ පුවත්පත් රැස්කිරීම, මුද්‍රණය කිරීම සහ ප්‍රකාශයට පත්කිරීම ;

(ඌ) ආයතනයේ කර්තව්‍යයන් ඉටුකිරීමට අදාළ විෂයයන් පිළිබඳ දේශන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම ;

(එ) ආයතනයේ කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ;

(ඒ) ආයතනයේ කාර්යයන් සඳහා කිසියම් ඇපයක් මත හෝ අන්‍යාකාරයකින් මුදල් ලබාගැනීම හෝ ණයට ලබාගැනීම සහ මණ්ඩලය විසින් සුදුසු යයි සිතන යම් ආකාරයකින් ආයතනය විසින් ණයට ගන්නා ලද හෝ ලබාගන්නා ලද ණය මුදල් ගෙවීම, ආරක්ෂිත කිරීම හෝ ඒවා ගෙවා නිදහස් කිරීම ;

(ඔ) ආයතනයේ අභිප්‍රායයන් තුළට ගැනෙන සියලුම ක්ෂේත්‍ර පිළිබඳව අදාළ ප්‍රකාශන සහ පර්යේෂණ වාර්තා ඇතුළත් පුස්තකාලයක් පිහිටුවීම ;

(ඕ) ආයතනයේ පුහුණුවකට යටත් විය හැකි සුදුසු තැනැත්තන් සඳහා ඉල්ලුම්පත් කැඳවා ඔවුන් තෝරා ගැනීම ;

(ක) මෙයට සමාන පරමාර්ථ දරන වෙනත් රටවල ආයතන සමග සහයෝගිතාවය පවත්වාගෙන යාම සහ වැඩකිරීමේ සබඳතාවයන් වැඩි දියුණු කිරීම ;

(ග) ආයතනයේ පරමාර්ථ වැඩිදියුණු කිරීමට අවශ්‍ය විය හැකි වෙනත් යම් ක්‍රියා සහ දේ කිරීම.

අධ්‍යයන මණ්ඩලය.

7. (මෙහි මින් මතු "අධ්‍යයන මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ අධ්‍යයන මණ්ඩලයක් තිබිය යුතු අතර, එය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(i) ආයතනයේ සභාපතිවරයා ;

(ii) ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(iii) රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා ;

(iv) 1978 අංක 16 විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද සියලු විශ්ව විද්‍යාලවල ; ශාස්ත්‍ර පීඨවල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි අංශවල සහ භාෂා අංශයේ අංශ ප්‍රධානීන් අතුරින් මණ්ඩලය විසින් විශ්ව විද්‍යාල කොමිෂන් සභාව විමසා පත් කරනු ලබන අංශ ප්‍රධානීන් හය දෙනෙක් ;

අධ්‍යයන මණ්ඩලයේ බලතල.

8. (1) අධ්‍යයන මණ්ඩලය ආයතනයට වගකිවයුතු අතර, එයට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය :—

(අ) ආයතනයේ අධ්‍යයන කටයුතුවලට අදාළ විය හැකි යම් කාරණා පිළිබඳ මේ පනතේ විධිවිධානවලට යටත්ව ආයතනයට උපදෙස් ලබාදීම ;

(ආ) ආයතනයේ රීතිවලට අනුකූලව විභාග පැවැත්වීම සහ යම් විභාග සමත් වී ඇති සහ ආයතනය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් කොන්දේසිවලින් සෑහීමට පත්ව ඇති ඩිප්ලෝමා සහතිකපත් සහ ආයතනයේ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම්ලත් තැනැත්තන් පිළිබඳ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඇ) මණ්ඩලය විසින් ආයතනය වෙත යොමු කරන ලද කිසියම් කාරණයක් පිළිබඳ වූ වාර්තා සැලකිල්ලට ගැනීම ;

(ඈ) ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන, පුහුණු වැඩසටහන් සඳහා වූ පාඨමාලා සහ විභාගවලට සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය වෙත නිර්දේශ සහ වාර්තා ඉදිරිපත් කිරීම ;

(ඉ) ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන, පුහුණු වැඩසටහන් සඳහා වූ පාඨමාලාවලට සහ විභාගවලට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සඳහා නියම කරනු ලැබිය යුතු නියමයන් පිළිබඳ මණ්ඩලයට නිර්දේශ කිරීම ;

(ඊ) ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන, පුහුණු වැඩසටහන් සඳහා වූ පාඨමාලවලට අදාළ රීති සකස් කිරීම සහ ඒ රීති මණ්ඩලය වෙත භාරදීම ;

(උ) ආයතනය විසින් පවත්වනු ලබන විභාගවල දී පරීක්ෂකවරුන් ලෙස පත් කිරීම සඳහා සුදුසු තැනැත්තන්ගේ නම් මණ්ඩලයට නිර්දේශ කිරීම ;

(ඌ) ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය පත් කිරීම, ඉවත් කිරීම සහ විනය පාලනයට අදාළ රීති, බඳවා ගැනීමේ යෝජනා ක්‍රම සහ ක්‍රියාපටිපාටිය, ඔවුන්ගේ වේතන, පාරිශ්‍රමික, දීමනා සහ ගාස්තු සහ ඔවුන් වැඩකරන පැය ගණන, විවේක සහ නිවාඩු පිළිබඳව මණ්ඩලයට නිර්දේශ කිරීම ;

(එ) ශිෂ්‍යයන්ට ප්‍රදර්ශන, ශිෂ්‍යාධාර, පදක්කම් සහ ත්‍යාග සඳහා ආයතනය විසින් සපුරාලිය යුතු කොන්දේසි පිළිබඳව මණ්ඩලයට නිර්දේශ කිරීම ;

(ඒ) ශිෂ්‍යත්ව, ප්‍රදර්ශන, ශිෂ්‍යාධාර, පදක්කම් සහ ත්‍යාග සඳහා මණ්ඩලය විසින් අනුමත කරන ලද කොන්දේසි සපුරා ඇති තැනැත්තන් පිළිබඳව මණ්ඩලයට නිර්දේශ කිරීම ;

(ඔ) මණ්ඩලයේ අනුමතිය ඇතිව අධ්‍යයන මණ්ඩලයේ අනුයෝජිතයන්ගෙන් සැදුම්ලත් කමිටු පත් කිරීම ; සහ

(ඕ) අධ්‍යයන මණ්ඩලයේ රැස්වීම්වලට අදාළව සහ එවැනි රැස්වීම්වල දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය පිළිබඳ රීති සකස් කිරීම.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කිසියම් අධ්‍යයන කාරණයක් සම්බන්ධයෙන් බලතල පවරනු ලැබ ඇත්තේ මණ්ඩලය හෝ යම් නිලධරයකු වෙත ද, ඒ මණ්ඩලය හෝ නිලධරයා විසින් අධ්‍යයන මණ්ඩලයේ පූර්ව නිර්දේශයක් ලබාගැනීමෙන් තොරව ඒ කාරණය සම්බන්ධයෙන් කිසිදු තීරණයක් නොගත යුතු ය. මණ්ඩලයේ හෝ ඒ නිලධරයාගේ තීරණය අධ්‍යයන මණ්ඩලයේ නිර්දේශයන්ට අනනුකූලවන අවස්ථාවක දී ඒ මණ්ඩලය විසින් හෝ ඒ නිලධරයා විසින් අධ්‍යයන මණ්ඩලයේ නිර්දේශ නොපිළිපැදීම පිළිබඳ හේතු ගෙන හැර දැක්විය යුතු ය.

(3) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි යම් සාමාජිකයකු පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් අධ්‍යයන මණ්ඩලයේ කිසිම ක්‍රියාවක්, නිර්දේශයක් හෝ වාර්තාවක් බලරහිත වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

## II වන කොටස

## ආයතනයේ කාර්ය මණ්ඩලය

**9**. (1) අමාත්‍යවරයා විසින් මණ්ඩලය විමසා කළමනාකරණ ක්ෂේත්‍රයේ විශිෂ්ඨත්වයක් දක්වා ඇති තැනැත්තන් අතරින් කෙනකු ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කළ යුතු ය. ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(3) මණ්ඩලයේ විධානයන්ට යටත්ව, අධ්‍යක්ෂ ජනරාල්වරයා පහත දැක්වෙන බලතල සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කළ යුතු ය :—

(අ) දේශීයව සහ ජාත්‍යන්තරව සම්බන්ධතා දක්වන අය පිළිබඳ ජාලයක් පිහිටුවීම ;

(ආ) ආයතනයේ කටයුතු පරිපාලනය සඳහා වගකිවයුතු වීම ;

(ඇ) ආයතනයේ කාර්ය මණ්ඩලයේ පත්කිරීම් සහ විනය පාලනය පිළිබඳ වගකිවයුතු වීම ;

(ඈ) ඔහු මණ්ඩලයේ ලේකම්වරයා විය යුතු ය ;

(ඉ) මණ්ඩලයේ තීරණයන් ක්‍රියාත්මක කිරීම සඳහා වගකිවයුතු වීම ; සහ

(ඊ) මණ්ඩලය විසින් ඔහුට පවරනු ලැබිය හැකි වෙනත් යම් කර්තව්‍යයන් ඉටුකිරීම.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයාට මණ්ඩලයේ යම් රැස්වීමක් නියෝජනය කර ස්වකීය මතය ප්‍රකාශ කිරීමට හිමිකම තිබිය යුතු අතර, ඒ රැස්වීම්වල දී ඡන්දය පාවිච්චි කිරීමට අයිතියක් නොතිබිය යුතු ය.

ආයතනයේ කාර්ය මණ්ඩලය ආදිය පත්කිරීම.

**10.** ආයතනය මේ පනතේ විධිවිධානවලට යටත් විය යුතු අතර, එයට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය :—

(අ) ආයතනයේ කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා සහ කාර්ය මණ්ඩලයේ විනය පාලනය ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනය විසින් අවශ්‍ය යයි සලකන පරිදි වූ යම් කාර්ය මණ්ඩලයක් පත් කිරීම ;

(ආ) කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික ප්‍රමාණය නියම කිරීම ;

(ඇ) ආයතනයේ කාර්ය මණ්ඩලයේ සේවා නියමයන් සහ කොන්දේසි තීරණය කිරීම.

රජයේ නිලධරයන් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත්කිරීම.

**11.** (1) මණ්ඩලයේ ඉල්ලීම පිට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ අදාළ අමාත්‍යාංශයේ හෝ අමාත්‍යාංශවල ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව ආයතනයේ කාර්ය මණ්ඩලයට එවැනිම කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) ආයතනයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ රජයේ නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) ආයතනයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු ආයතනය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ආයතනයට සේවය කරනු ලබන යම් කාලයක්, ඒ ගිවිසුම යටතේ ඒ තැනැත්තාගේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලැබූ සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ ඉල්ලීම පිට, යම් උසස් අධ්‍යාපන ආයතනයක නිලධරයකු හෝ සේවකයකු සහ ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ ද කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම ද ඇතුළුව මණ්ඩලය සහ ඒ ප්‍රධාන විධායක නිලධරයා විසින් එකඟවනු ලැබිය හැකි කොන්දේසි මත ඒ නිලධරයා හෝ සේවකයා ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(6) යම් උසස් අධ්‍යාපන ආයතනයක සේවකයකු හෝ නිලධරයකු ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ සේවකයා හෝ නිලධරයා ද යටත් විය යුතු ය.

(7) මේ වගන්තියේ " උසස් අධ්‍යාපන ආයතනය" සහ "ප්‍රධාන විධායක නිලධරයා" යන යෙදුම්වල පිළිවෙලින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ ඒ යෙදුම්වලට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

## III වන කොටස

## මුදල්

**12**. (1) ආයතනයට ආයතනයේම අරමුදලක් තිබිය යුතු ය. ආයතනයේ අරමුදල.

(2) ආයතනයේ අරමුදලට —

(අ) ආයතනයේ ප්‍රයෝජනය සඳහා කලින් කල පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) ආයතනය විසින් එහි බලතල සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී ආයතනයට ලැබෙන සියලු මුදල් ;

(ඇ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත කවර හෝ ප්‍රභවයකින් පරිත්‍යාග, ත්‍යාග සහ ප්‍රදාන වශයෙන් ආයතනයට ලැබෙන සියලු මුදල් ; සහ

(ඈ) ආයතනයේ අරමුදල් ආයෝජනය කිරීමෙන් ඇතිවන ආදායමක් ලෙස ලැබෙන සියලු මුදල්,

ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ආයතනයේ බලතල සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී ආයතනය විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය විය හැකි සියලු මුදල් සහ මේ පනතේ කිසියම් විධිවිධානයකින් ආයතනයේ අරමුදලින් ගෙවිය යුතු යයි බලය දෙන ලද හෝ නියම කරන ලද වෙනත් වියදම් කිසිවක් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ආයතනයේ මුදල් වර්ෂය සහ ආයතනයේ ගිණුම් විගණනය කිරීම.

**13**. (1) ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) ආයතනයේ ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වා ගෙන යාමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, ආයතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## IV වන කොටස

## පොදු විධිවිධාන

මණ්ඩලයේ බලතල මණ්ඩලයේ සභාපතිවරයාට පැවරීම.

**14**. (1) මේ වගන්තිය යටතේ වූ මණ්ඩලයේ බලතල හැර, මණ්ඩලයේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය කිසිවක් මණ්ඩලය විසින් මණ්ඩලයේ සභාපතිවරයා වෙත පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් පවරනු ලැබ ඇත්තේ මණ්ඩලයේ සභාපතිවරයා වෙත නම් ඔහු විසින් මණ්ඩලයේ විධානයන්ට යටත්ව ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, සිදු කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

**15**. (1) (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) උපදේශක සභාව යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් තිබිය යුතු අතර, ඒ මගින්, ආයතනයේ ප්‍රවර්ධනය උදෙසා ගනු ලබන පියවරවල්වල ඵලදායකත්වය පිළිබඳ ආයතනයට උපදෙස් ලබා දීමත් ආයතනයට අදාළ ගැටළු සහ ආයතනයේ සංවර්ධනය පිළිබඳ සාකච්ඡා කිරීමට සාකච්ඡා මණ්ඩලයක් සලසා දීම කළ යුතු ය. උපදේශක සභාව.

(2) ජාතික ඒකාබද්ධතා පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින්, භාෂා, සාහිත්‍ය සහ අධ්‍යාපන යන ක්ෂේත්‍රවල විශිෂ්ඨත්වයක් ලබාගෙන ඇති තැනැත්තන් අතුරින් පත් කරනු ලබන පස්දෙනෙකුගෙන් සභාව සමන්විත විය යුතු ය.

**16**. ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම, සිදු කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන පරිදි යම් ස්ථාවර කමිටු හෝ තත් කාර්යය සඳහා වූ කමිටු ගණනක් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය. ස්ථාවර කමිටු හෝ තත්කාර්ය සඳහා වූ කමිටු පත්කර ගැනීමට මණ්ඩලය සතු බලය.

**17**. ජාතික ඒකාබද්ධතා පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් කලින් කලට මණ්ඩලය විමසා මේ දක්වා මණ්ඩලයේ ප්‍රතිපත්තිමය කාරණාවලට අදාළ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම පිණිස මණ්ඩලය වෙත ලියවිල්ලකින් යම් සාමාන්‍ය හෝ විශේෂ විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, ඒ විධාන බලාත්මක භාවයට පත් කිරීම මණ්ඩලයේ කාර්යය විය යුතු ය. මණ්ඩලයට කෙරෙන විධාන.

**18**. මණ්ඩලයේ සියලු සාමාජිකයන් සහ ආයතනයේ නිලධාරීන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය. මණ්ඩලයේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**19**. ආයතනය,අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අර්ථකථනය කළ යුතු ය. අල්ලස් පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**20**. (1) මණ්ඩලයේ සෑම සාමාජිකයෙක්ම සහ ආයතනයේ සියලුම නිලධාරීන් සහ සේවකයන් තම රාජකාරී ආරම්භ කිරීමට පෙර ආයතනයේ ක්‍රියාකාරිත්වය හා සම්බන්ධ සියලු කරුණු පිළිබඳ දැඩි රහස්‍යභාවයක් රහස්‍යභාවය පිළිබඳ ප්‍රකාශය.

පිළිපදින බවට ප්‍රතිඥා දෙමින් ප්‍රකාශනයක් අත්සන් කළ යුතු අතර, ස්වකීය කටයුතු ඉටු කිරීමේ දී තමන්ට දැන ගන්නට ලැබෙන කිසිදු කරුණක්—

(අ) අධිකරණයකින් හෙළිදරව් කරන ලෙස නියම කර ඇති විට ; සහ

(ආ) මේ පනතේ යම් යම් විධිවිධානවලට අනුකූලව හෙළිදරව් කළ යුතු අවස්ථාවල දී හැර,

වෙනත් කිසිදු අවස්ථාවක දී හෙළිදරව් නොකළ යුතු බවට ප්‍රතිඥාවක් ද එම ප්‍රකාශයෙන් ප්‍රකට විය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය රාජකාරී කටයුතු කිරීමේ දී තමාට දැනගන්නට ලැබෙන යම් කිසි තොරතුරක් මෙහි (1) වන උප වගන්තියෙන් බලය දී ඇති කාර්යයන් සඳහා නොව වෙනත් කාර්යයන් සඳහා කවර පුද්ගලයකුට හෝ හෙළිදරව් කරන මණ්ඩලයේ සාමාජිකයෙක් හෝ ආයතනයේ නිලධාරියෙක් හෝ සේවකයෙක් මේ පනත යටතේ වරදකට වරදකරුවකු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දසදහසකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය.

නියෝග.

**21**. (1) මේ පනතේ නියමයන් සහ විධිවිධාන ඉටු කිරීමේ කාර්යය සඳහා හෝ නියම කරනු ලැබිය යුතු යයි නියමිත කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් මේ පනත යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) එවැනි සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන දින සිට හෝ නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද එවැනි සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

**22**. (1) ආයතනයේ යම් කාර්යයක් සඳහා රජයේ යම් නිශ්චල දේපළක් අවශ්‍යවන අවස්ථාවක, ඒ කාර්යය රජයේ ඉඩම් ආඥා පනතේ 6 වන වගන්තිය යටතේ විශේෂ ප්‍රදානයක් හෝ බඳුදීමක් කළ හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ආයතනය වෙත කරනු ලබන, ඒ දේපළෙහි විශේෂ ප්‍රදානයකට හෝ බදු දීමකට ඒ ආඥා පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

නිශ්චල හෝ චංචල රජයේ දේපළ ආයතනයට ලබා දිය යුතු බව.

(2) ආයතනයේ යම් කාර්යයක් සඳහා රජයේ යම් චංචල දේපළක් අවශ්‍යවන අවස්ථාවක ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ඒ චංචල දේපළෙහි සන්තකය හා පාවිච්චිය අධිකාරිය වෙත පවරා සතු කර දෙනු ලැබිය හැකි ය.

**23**. එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී ඒ ඒ වර්ෂය තුළ ආයතනයේ කටයුතු පිළිබඳ වාර්තාවක් මණ්ඩලය විසින් පිළියෙල කර ඒ වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අමාත්‍යවරයා විසින් ඒ වාර්තාව අනුමත කිරීමෙන් පසු පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

වාර්ෂික වාර්තාව.

**24**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**25**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ —

අර්ථ නිරූපණය.

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන, ඉටු කරන හෝ කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ ඇතිකොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ද ඊට ඇතුළත් වේ ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ පරිච්ඡේදය මගින් පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ ; සහ

"විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විශ්ව විද්‍යාල කොමිෂන් සභාව අදහස් වේ.

## උපලේඛනය

(3 වන වගන්තිය)

1. මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ කටයුතු කිරීමට නුසුදුසු යම් තැනැත්තකු —

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත් ;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ පුරවැසියකුව සිටීම නතර වුවහොත් ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු බවට තීරණය කරනු ලැබ තිබේ නම් හෝ ඒ බව ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ නම් ;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම් ; හෝ

(ඉ) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 303 වන වගන්තියේ හෝ 306 වන වගන්තියේ විධිවිධාන යටතේ කටයුතු කර ඇත්නම්.

2. මණ්ඩලයේ සෑම සාමාජිකයකුම, මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් තම ධුරය කලින් හිස් කරතහොත් මිස, තමා පත් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස ඔහු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය:

එසේ වුවද, මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් ධුරය හිස් කරනු ලබන යම් සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයෙක් තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

3. ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ යම් සාමාජිකයකු හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. මේ ඡේදය යටතේ නියමයක් කරන ලද්දේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් ද, ඒ සාමාජිකයා ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරන ලද දිනයේ සිට ස්වකීය ධුරය හිස්කර ඇතැයි සලකනු ලැබිය යුතු ය.

4. මණ්ඩලයේ සාමාජිකයකු විසින් අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලිඛිතව පිළිගනු ලැබීම මත බලාත්මක විය යුතු ය.

5. මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් මණ්ඩලයේ යම් සාමාජිකයකු ධුරය හිස් කරනු ලැබූ අවස්ථාවක දී, 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත් වෙමින්, අමාත්‍යවරයා විසින්, ඒ සාමාජිකයා වෙනුවට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. එසේ ඒ සාමාජිකයා වෙනුවට පත් කරන ලද යම් තැනැත්තකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

6. රෝගාතුරවීම, අබලතාවට පත්වීම හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම සහ ස්වකීය ධුරයේ කාර්යය ඉටු කිරීමට මණ්ඩලයේ යම් සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ නොහැකියාව පිළිබඳව අමාත්‍යවරයා වෙත ලිඛිතව දැනුම් දීම ඒ සාමාජිකයාගේ කාර්යය විය යුතු ය. ඉන් අනතුරුව අමාත්‍යවරයා විසින් 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත් වෙමින් ඒ කාලය තුළ ඔහු වෙනුවෙන් වැඩ බැලීම පිණිස වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

7. අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමික මණ්ඩලයේ සාමාජිකයන්ට ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

8. (1) මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටින්නේ නම්, මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති නම්, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් එක් සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත්කර ගනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තුන්දෙනකු විය යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක මුලසුන දරන තැනැත්තාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් ඇත්තේ ය.

(4) මේ ඡේදයේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් එහි කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

9. මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් ම පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් නිර්බල වන්නාක් සේ නොසැලකිය යුතු ය.

10. (1) ආයතනයේ මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කොට සකස් කර ගත හැකි අතර, එය මණ්ඩලය විසින් නිශ්චය කරන යම් ආකාරයකට වෙනස් කර ගනු ලැබිය හැකි ය.

(2) ආයතනයේ මුද්‍රාව, මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තිබිය යුතු ය.

(3) මණ්ඩලයේ අවසර ඇතිව සහ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හා මණ්ඩලයේ එක් සාමාජිකයකු ඉදිරිපිටදී හැර, ආයතනයේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට, වෙනත් ලේඛනයකට හෝ නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටින බවට සළකුණක් වශයෙන් ඒ දෙදෙනා ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය.

(4) ආයතනයේ මුද්‍රාව තබනු ලබන සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් මණ්ඩලය විසින් පවත්වා ගෙන යා යුතු ය.

11. (1) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ සභාපතිවරයාට ඔහුගේ ධුරයේ කාර්යය කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක ඔහු වෙනුවට කාර්යය ඉටු කිරීම සඳහා මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් හේතු දක්වා සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) සභාපතිවරයා විසින්, අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් එය ලිඛිතව පිළිගැනීම මත බලාත්මක විය යුතු ය.

(4)(2) වන හා (3) වන ඡේදයන්හි විධිවිධානයන්ට යටත්ව සභාපතිවරයාගේ ධුර කාලය මණ්ඩලයේ ඔහුගේ සාමාජිකත්ව කාල සීමාව විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.